# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1658/35 – 2010 ජුනි 17 වැනි බ්‍රහස්පතින්දා – 2010.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අමාත්‍යාංශයේ අංකය: එල්ඩී/05/2008/එෆ්එච්/134.
මගේ අංකය: 4/6/1-1/734ඡ්/03.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 734ඡ් - කුඩා පයාගල දකුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ මු.පි.ක. 4183 දරන පිඹුරේ කැබලි අංක 01:

**කැබලි අංක 01**
ඉඩමේ නම: සමරප්පුවත්ත; විස්තරය: ධීවරසේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම; හිමිකම් කියන අය: ඈන් බෝයිස් ෆ්‍රැන්ක්ලීන්, පර්ල් බැන්ක් ස්ටේට්, අම්බදණ්ඩෙගම, බණ්ඩාරවෙල; ප්‍රමාණය: හෙක්. 0.0253.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2010 අගෝස්තු මස 28 වැනි දින පෙ.ව. 10.00 ට බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හා සම්මුඛ විය යුතුය.

තවද, 2010 අගෝස්තු මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණනය කල ආකාරයත් මා වෙත පිටපත් දෙකකින් වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

විමල් ගුණතුංග,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2010 ජුනි මස 07 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 – 135

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහ පත්තුව දෙබහැර ගමේ පිහිටි ගම්පහ මැණුම් අධිකාරිගේ පිඹුරු

අංක මු.පි.ගම්. 3726 දරන පිඹුරේ කැබලි අංක 01, 02, 03 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 17.6720 ක් ලෙස සටහන් වන මැටිහක්ක වත්ත නමැති ඉඩම:

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2010 ජුනි මස 30 වැනි දින පෙ.ව. 10.00 ට මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා හා සම්මුඛ විය යුතුය.

තවද, 2010 ජුනි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණනය කල ආකාරයත් මා වෙත පිටපත් දෙකකින් වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. එන්. කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2010 ජුනි මස 09 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 – 136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.